# කැලණිය විශ්වවිද්‍යාලය - සමාජීය විද්‍යා පීඨය

## ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි ප්‍රථම වසර

## 2016/2017 අධ්‍යයන වර්ෂය - දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය

## (2019 ජනවාරි)

## ක්‍රීඩා සහ විශ්‍රාන්ති කළමනාකරණය

## SRMG 22474: ක්‍රීඩා සහ විශ්‍රාන්තිය තුළ සමාජ ප්‍රශ්න

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 06 යි. කාලය : පැය 03 යි.**

01. ක්‍රීඩා කළමනාකරුවෙකු විසින් ක්‍රීඩා සමාජ විද්‍යාව අධ්‍යයනය කළ යුත්තේ ඇයි? ඔබගේ පිළිතුර සාධක සහිතව සනාථ කරන්න. (ලකුණු 20)

02. (i) "ක්‍රීඩා සමාජ සුසාධ්‍යකරණය" (Social Facilitation in Sport) පිළිබඳ කෙටි විග්‍රහයක යෙදෙන්න.

    (ii) ක්‍රීඩා සමාජ විද්‍යාවේ අවධානයට යොමු වන ක්ෂුද්‍ර න්‍යායක් (Micro Theory) පිළිබඳව කෙටි රචනාවක් ලියන්න. (ලකුණු 10 x 2)

03. කෝල්බර්ග්ගේ මාදලිය (Kohlberg's Model) කුඩා දරුවන්ගේ ක්‍රීඩා චර්යාව ආශ්‍රිත ගැටලු කළමනාකරණය කර ගැනීම සඳහා භාවිත කළ හැක්කේ කෙසේද? නිදසුන් සහිතව විග්‍රහ කරන්න. (ලකුණු 20)

04. "අතීතයේ විසූ කාන්තාවට සාපේක්ෂව වත්මන් කාන්තාවට ක්‍රීඩාවේ යෙදීමට ඇති අවස්ථා වර්ධනවය වී තිබේ". උදාහරණ සහිතව මෙම ප්‍රකාශය සනාථ කරන්න.

(ලකුණු 20)

05. ක්‍රීඩාවේ ආචාරධර්මවලට අනුකූලව ක්‍රීඩා කිරීම තුළින් ක්‍රීඩාවේ දියුණුව ඇති කළ හැකි ආකාරය විමසුමට ලක් කරන්න.

(ලකුණු 20)

06. "ක්‍රීඩාව ලොව ගැටුම් නිරාකරණය කිරීමේ කදිම මෙවලමකි". මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේද? හේතු දක්වන්න. (ලකුණු 20)